## ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම - 2017

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------------

2007 අංක 07 දරන සමාගමේ පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගමේ පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------

#### 2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ පිරිවැය රු.380,600 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රයක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණු අතර ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.3.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.16,683,524 ක් වූ වාහන සහ පිරිවැය රු.550,491 ක් වූ ගෘහ භාණ්ඩවලට අදාලව සමුච්චිත ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.17,603,895 ක් හා රු.625,738 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් පිරිවැය ඉක්මවා රු.995,618 කින් එම වත්කම් ක්ෂය කර තිබුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2000 වර්ෂයේ සිට 2010 දක්වා වූ වර්ෂවලට අදාලව ලැබිය යුතු රඳවා ගැනීම් බදු රු.1,118,392 ක් සහ ලැබිය යුතු එකතු කල අගය මත බදු රු.1,340,623 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අය විය යුතු බවට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ඊට අදාල මූලාශ්‍ර ලේඛන නොතිබූ අතර ඒවා අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ආ) විදේශ රැකියා සඳහා පිටත්ව එතෙර දී මියගිය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල ලැබී තිබූ එකතුව රු.6,484,111 ක් වූ මරණ වන්දි සමාලෝචිත වර්ෂය අවසානවන විටත් අදාල පාර්ශව වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 / 2007 වර්ෂවල කොරියාවට පිටත් කරන ලද ශ්‍රී ලාංකික විගමණික සේවකයින් 824 දෙනෙකුගෙන් අයකරන ලද රු.41,200,000 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු මුදලින් එකතුව රු.16,460,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාල පාර්ශවයන්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වසරකට වඩා වැඩි කාලයක සිට පවතින රු.7,728,284 ක් වටිනා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට සහ වටිනාකම රු.2,938,020 ක් වූ ණය ගැති ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09.12 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ විධිමත් අනුමැතියකින් තොරව ඒජන්සි කාර්ය මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග එක්ව රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඒ සඳහා වාරික මුදල් ලෙස 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුල එකතුව රු.5,368,296 ක් සමාගමේ අරමුදලින් දරා තිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i) සමාගමෙහි සභාපතිගේ මාසික ඉන්ධන දීමනාව ලීටර් 170 කට සීමා විය යුතු වුවද, 2016 වර්ෂයේ මැයි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුල එම සීමාව ඉක්මවා වටිනාකම රු.470,274 ක් වූ ඉන්ධන ලීටර් 4176 ක් භාවිතා කර තිබූ අතර එම අතිරේක ඉන්ධන සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br><br>(ii) කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් පමණක් ලබාදිය හැකි සමාගමේ නිලධාරීන් තිදෙනෙකු වෙත 2017 වර්ෂයේ මාස 03 ක් සඳහා ඉන්ධන දීමනා ලෙස රු.77,220 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.103,278 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.2,008,515 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,905,237 කින් පිරිහී තිබුණි. සමාගමේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වූ කොරියාව සහ ඊශ්‍රායල් රාජ්‍යයන් වෙත යවනු ලබන ශ්‍රමිකයින් වෛද්‍ය පරීක්ෂණ වෙත යොමු කිරීමෙන් උපයන ආදායම රු.5,429,080 කින් අඩුවීම හා පෞද්ගලික ආයතනයක් සමග පවත්වාගෙන ගිය වෛද්‍ය මධ්‍යස්ථානයේ කොමිස් ආදායම ලෙස ඉකුත් වර්ෂයේ දී රු.10,693,006 ක් ලැබී තිබුණද එම ආදායම සමාලෝචිත වර්ෂයේ දී අහිමිවීමත්, රක්ෂණ වන්දි ගෙවීම් රු.3,538,260 කින් ඉහළයාමත්, ඉහත ඌනතාවයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාගම සතුව තිබූ ප්‍රධාන ආදායම් මාර්ග 05 කින් 02 ක් සමාලෝචිත වර්ෂය තුල මුළු මනින්ම අහිමි වී තිබීම හේතුවෙන් සමාගමෙහි ව්‍යාපාර කටයුතු වලින් උපයන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 17.38 කින් අඩු වී තිබූ අතර සමස්ත ආදායමින් සියයට 25 ක් ස්ථාවර තැන්පතු ආයෝජන මගින් උපයන ලද පොලියෙන් සමන්විත වී තිබුණි. මේ අනුව, සමාගම එහි ව්‍යාපාරික කටයුතු පුළුල් කරමින් නව ආදායම් මාර්ග ඉපැයීම කෙරෙහි අවධානය යොමු නොකළහොත් ඉදිරි වර්ෂවල මූල්‍ය අර්බුදයකට මුහුණදීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

1985 අංක 25 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට, විදේශ රැකියා නියෝජිතායතනයක කාර්ය භාරය කරගෙනයාමේ හැකියාව ලැබී තිබුණි. එම අධිකාරීත්වය මත ඊට පූර්ණ හිමිකාරීත්වය ඇතිව ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම පිහිටුවා තිබුණි. සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව, විදේශ රැකියා නියෝජිත ආයතනයක් ලෙස හා විදේශගතවන ශ්‍රමිකයන් පුහුණු කිරීම ඇතුළුව ක්ෂේත්‍රයට අදාලව පුළුල් පරාසයක කටයුතු කිරීමේ හැකියාව ලැබී තිබුණි. එමෙන්ම මෙම ක්ෂේත්‍රයේ ව්‍යාපාරික කටයුතු කළ හැකි එකම රාජ්‍ය ආයතනය මෙම සමාගම වේ. එහෙත් මෙම ශක්තිතාවය (Strength) සහ ව්‍යාපාරික අවස්ථාව (Business Opportunity) උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද සමාගම අපොහොසත් වී තිබූ බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ දී ශ්‍රී ලංකාවට රැකියා අවස්ථා 310,786 ක් ලැබී තිබුන ද ඉන් සමාගම විසින් රැකියා අවස්ථා 427 ක් එනම් සියයට 0.14 ක් සඳහා පමණක් විදේශගත කර තිබුණි. එමෙන්ම 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ලැබුණු රැකියා ඇණවුම් සංඛ්‍යාව 09 කින් හා රැකියා අවස්ථා සංඛ්‍යාව 2211 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ජෝර්දාන්, සිංගප්පූරු සහ බහරේන් යන රාජ්‍යයන් වලින් ලැබුණු රැකියා අවස්ථා පිළිවෙලින් 140 ක්, 100 ක් සහ 60 ක් සඳහා සුදුසු ශ්‍රමිකයන් යැවීමට

සමාගමට නොහැකි වී තිබුණි. එමෙන්ම මාලදිවයිනෙන් ලද කාර්මික හා වෘත්තිය රැකියා අවස්ථා 58 කින් 55 ක් සඳහාද ශ්‍රමිකයින් යොමුකර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ කටාර්, කුවේට් සහ ඕමාන් යන රටවලින් රැකියා ඇණවුම් ලැබී තිබුණද ඒ සඳහා ශ්‍රමිකයින් යොමු කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේ එම රටවලින් රැකියා ඇණවුම් කිසිවක් ලැබී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී විගමණය කරන ලද 806 ක් වූ විගමණිකයන්ගෙන් ඍජු හා අවබෝධතා ගිවිසුම් මත විදේශගත වූ ප්‍රමාණය හැරුණු විට සමාගම විසින්ම සොයාගත් රැකියා සඳහා විගමණය කළ ප්‍රමාණය 44 ක් වූ අතර එය සමාගමෙහි සමස්ත විගමණිකයන්ගෙන් සියයට 5 ක් පමණ අඩු මට්ටමක පැවතුණි.

(ඉ) සමාගම විසින් රැකියා සඳහා ශ්‍රමිකයින් යොමු කළ රටවල් සංඛ්‍යාව පසුගිය වර්ෂවල සිට ක්‍රමානුකූලව අඩුවෙමින් පැවති අතර 2013 වර්ෂයේ රටවල් 13 ක් වූ එම සංඛ්‍යාව සමාලෝචිත වර්ෂය වන විට 05 ක් දක්වා අඩු වී තිබුණි.

(ඊ) 2015 වර්ෂයේ දී විදේශ රැකියා වර්ග 32 ක් සඳහා ශ්‍රමිකයන් විදේශගත වී තිබුණද 2016 හා 2017 වර්ෂවලදී පිළිවෙලින් එය රැකියා වර්ග 07 ක් හා 10 ක් දක්වා අඩු වී තිබූ අතර 2015 වර්ෂය හා සැසඳීමේ දී එම අඩුවීමේ ප්‍රතිශතය සියයට 78 ක් විය.

(උ) සමාගමෙහි ප්‍රධාන අරමුණක් වූ විදේශ රැකියා ප්‍රවර්ධනය වෙනුවෙන් විදේශ සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා 2016 හා 2017 වර්ෂවල පිළිවෙලින් එකතුව රු.6,349,683 ක් සහ රු.2,525,249 ක් වැය කරමින් අවස්ථා 10 ක දී සමාගමේ නිලධාරීන් විදේශ සංචාර සඳහා සහභාගී වී තිබුණි. එහෙත් අපේක්ෂා කල පරිදි විදේශ රැකියා අවස්ථා වර්ධනයක් සිදු වී නොතිබුණි. එමෙන්ම එසේ ලබාගත් බව සඳහන්ව තිබූ රැකියා අවස්ථා 3,616 කින් ශ්‍රමිකයින් යොමු කිරීමට හැකි වී තිබුණේ රැකියා 1,213 කට පමණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) ඊශ්‍රායල් රාජ්‍ය සඳහා කෘෂිකාර්මික සේවකයන් සැපයීම සම්බන්ධයෙන් ඇතිකරගෙන තිබූ ගිවිසුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඊශ්‍රායල් රාජ්‍ය හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව, සමාගම හරහා විදේශගතවන සේවකයින් අදාල රැකියා කාල සීමාව අවසන්වීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමට අවශ්‍ය සියළුම පියවර සමාගම විසින් ගත යුතු වේ. එහෙත් පසුගිය වර්ෂ 04 තුල විදේශ ගත වූ ශ්‍රමිකයින් 1043 දෙනෙකු අතරින් 92 ක් රැකියා කාල සීමාව අවසන් වී නැවත සියරටට පැමිණ නොතිබුණද ඔවුන් ගෙන්වා ගැනීමට සමාලෝචිත වර්ෂය නිමවන විටත් සමාගම අපොහොසත් වී තිබුණි.

(ii) විදේශගතවන සේවකයින් සමග ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම ඇති කරගත් ගිවිසුම අනුව, භාරගනු ලබන කාර්යයන්, බැඳීම් හා යුතුකම් ඉටු කිරීම පැහැර හැරී අවස්ථාවල සේවා නියුක්තිකයා හා වන්දි දායකයන් විසින් අදාල බැඳුම්කර වටිනාකමට සමාන මුදලක් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත ගෙවිය යුතුව තිබුණි. එහෙත්" ඉහත සඳහන් 92 දෙනාගෙන් 70 දෙනෙකු සම්බන්ධයෙන් අවශ්‍ය නීත්‍යානුකූළ ක්‍රියාමාර්ග ගැනීම වර්ෂ 01 ත් 04 ත් අතර කාලයක් ප්‍රමාද වී තිබූ අතර 19 දෙනෙකු සම්බන්ධයෙන් විගණන දිනය වූ 2018 ජුනි 12 දින වන විටත්

අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව, රු.28,500,000 ක් පමණ වූ බැදුම්කර වටිනාකම සමාගම වෙත ලබා ගැනීමට තිබූ අවස්ථා මගහැරී තිබූ අතර ඉහත දක්වා ඇති පරිදි ගිවිසුම් කඩ කිරීම මත ශ්‍රී ලංකා රජයට ඊශ්‍රායල් රාජ්‍යයෙන් ලැබීමට ඇති රැකියා අවස්ථා නොලැබීමේ අවදානමක්ද පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ මූලික අරමුණු ඉටු කිරීමේ දී නීත්‍යානුකූලව අයකල හැකි ගාස්තුවලට අමතරව විධිමත් අනුමැතියකින් සහ නිශ්චිත ක්‍රමවේදයකින් තොරව, පෞද්ගලික සබඳතා මත සොයා ගන්නා රැකියා සඳහා විදේශගතවීමට බලාපොරොත්තුවන විගමණිකයන්ට අවශ්‍ය සේවා සැපයීම හා විදේශ රැකියා සඳහා යොමුවන පුද්ගලයන් පිළිබඳ තොරතුරු දත්ත මූලාශ්‍රයකට ඇතුලත් කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ දී එකතුව රු.6,733,143 ක ආදායමක් සමාගම විසින් උපයාගෙන තිබුණි.

(ඇ) සමාගම විසින් පෞද්ගලික ආයතනයක් සමග ඇතිකරගත් ගිවිසුමකට අනුව, 2013 වර්ෂයේ දී කුලී ගොඩනැගිල්ලක වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කර තිබූ අතර රැකියා සඳහා කොරියාව සහ ඊශ්‍රායලය වෙත පිටත්වන ශ්‍රමිකයන්ට වෛද්‍ය වාර්තා නිකුත් කිරීම මෙම ආයතනයේ ප්‍රධාන කාර්යය වී තිබුණි. සමාගම සමඟ එළඹ තිබූ ගිවිසුම අනුව ඒජන්සිය විසින් ව්‍යාපාරික කටයුතු අවසන් කර ගිවිසුම අවසන්වීම සමාගම වෙත දැනුම් දුන් පසු ව්‍යාපාරික ස්ථානයෙන් ඉවත් විය යුතු වුවද 2016 සැප්තැම්බර් 26 දින ව්‍යාපාරික කටයුතු නවතා දමන ලෙස සමාගම වෙත දන්වා තිබුණද විගණන දිනය වූ 2018 අප්‍රේල් 24 දින වන විටත් ගොඩනැගිල්ලෙන් ඉවත් වී නොතිබීම හේතුවෙන් එම කාලයට අදාලව එකතුව රු.1,320,000 ක පමණ ගොඩනැගිලි කුලියක් ගෙවීමට සමාගමට සිදුවී තිබුණි. ඊට අදාල නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන සිදු වී ඇති පාඩුව ආවරණය කර ගැනීමට විගණන දිනය වූ 2018 ජුලි 30 දින වන විටත් සමාගමට නොහැකි වී තිබුණි.

(ඈ) රැකියා සඳහා විදේශගතවන ශ්‍රමිකයන් තම සේවා කාලය තුල පූර්ණ අකර්මන්‍යතාවයකට, අර්ධ අකර්මන්‍යතාවයකට හෝ මරණයට පත් වුවහොත් වන්දි මුදලක් ලබාදීම සහ ලංකාවට ගෙන්වා ගැනීමට යන වියදම ප්‍රතිපූර්ණය කර දීමේ අරමුණින් "සහන රක්ෂණ අරමුදල" නමින් රක්ෂණ යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එක්ව ක්‍රියාත්මක කරතිබුණි.

මීට අදාලව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ සමාගම අතර ඇති කරගත් ගිවිසුමෙහි රක්ෂණ ආවරණ කාලය අවුරුදු 02 ක් වූ අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුම අනුව රක්ෂණ ආවරණ කාලය අවුරුදු 02 කට අමතරව මාස 03 ක සහන ආවරණ කාලයක් දක්වා තිබුණි. රක්ෂණ යෝජනා ක්‍රමය යටත් සහන කාලය සඳහා වන්දි ගෙවීම පිළිබඳ නිශ්චිත තීරණයකින් තොරව 2015 මාර්තු මාසයේ සිට එම රක්ෂණ ක්‍රමය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතට පත්කරගෙන තිබූ අතර ඒ අනුව සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්තක් සමාගමට අහිමි වී තිබුණි. එහෙත් අමතර ආවරණ කාලය තුල රක්ෂිතයන්ට සිදු වූ හානි පූර්ණයේ වගකීම සමාගමට දැරීමට සිදුවීම හේතුවෙන් සමාගම සතුව තිබූ ස්ථාවර තැන්පතු ආයෝජන ආපසු ලබාගෙන එම කාලය සඳහා වන්දි ලෙස එකතුව රු.4,400,000 ක් ගෙවා තිබුණි.

(ඉ) 2017 අගෝස්තු 22 දින ඊශ්‍රායල් රාජ්‍යයට යැවීමට සැලසුම් කල ශ්‍රමිකයින් 08 දෙනෙකුගේ ගුවන් ටිකට්පත් නියමිත දිනට පෙර මිලදී ගැනීමට නොහැකිවීමෙන් සිදු වූ ප්‍රමාදය හේතුවෙන් එම පුද්ගලයින් නැවත වෛද්‍ය පරීක්ෂණයට යොමු කිරීමට සිදු වී තිබූ අතර ඒ වෙනුවෙන් රු.121,500 ක අතිරේක මුදලක් සමාගම විසින් දරා තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

---

2017 දෙසැම්බර් 31 දින වන විට සමාගම සතුව බැංකු ජංගම ගිණුම් 06 ක් පැවති අතර වර්ෂය තුල ඉන් 3 ක් පමණක් සක්‍රියව පැවතුණි. බැංකු ප්‍රකාශන අනුව එම ජංගම ගිණුම්වල වර්ෂ අවසාන ශේෂයන්ගේ එකතුව රු.12,599,467 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මාර්තු සිට දෙසැම්බර් දක්වා මාසවල රු.මිලියන 08 ත් 21 ත් අතර ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙසේ නිෂ්ක්‍රීය ජංගම ගිණුම් පවත්වාගෙන යාම සහ ජංගම ගිණුම්වල අතිරික්ත ශේෂයන් පවත්වාගෙන යාම මූල්‍ය කළමණාකරණයේ දුර්වලතාවයක් බව විගණනයේ දී නිරීක්ෂණය විය. තවද, සමාගම නමින් සමාලෝචිත වර්ෂය නිම වන විට ඉතිරි කිරීමේ ගිණුම් 08 ක් පැවති අතර ඉන් එකතුව රු.164,165 ක ශේෂ සහිත ගිණුම් 05 ක් 2014 වර්ෂයේ සිටද රු.2,100 ක ශේෂ සහිත ගිණුමක් 2016 වර්ෂයේ සිටද අක්‍රියව පැවතුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය ප්‍රකාරව සමාගමෙහි අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට හැකිවන පරිදි කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට සහ 9.3.1 ඡේදය ප්‍රකාරව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) නියැදි විගණන පරීක්ෂාවට භාජනය වූ පසුගිය වර්ෂ 06 තුල ඉහළ හා මධ්‍යම කළමනාකරණ මට්ටම්වලට අදාල තනතුරු දිගින් දිගටම පුරප්පාඩුව පැවති අතර එම තනතුරු සඳහා ද්විතියික හා වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත් කිරීම හෝ පුරප්පාඩු පිරවීමෙන් තොරව පවත්වාගෙන යාම සාමාන්‍ය ක්‍රමවේදය වී තිබු බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය වු අතර මෙම තත්ත්වය ආයතනයේ ඉදිරි පැවැත්මට බාධාවක් වී තිබුණි.

(i) සාමාන්‍යාධිකාරි තනතුර 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති ඇති අවස්ථා 07 කදී වැඩ බැලීමේ පදනම මත කාර්යාංශ නිලධාරීන් පත්කර තිබු අතර එක් එක් නිලධාරියා විසින් එම තනතුරේ සේවය කර තිබු උපරිම කාලය මාස 17 ක් වී තිබුණි.

(ii) මුල්‍ය කළමනාකරු තනතුර 2017 අප්‍රේල් සිට සහ 2018 මාර්තු දක්වා පුරප්පාඩුව පැවති අතර විගණන දිනය වු 2018 ජුනි වන විට වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු පත් කර තිබුණි.

(iii) ව්‍යාපාර ප්‍රවර්ධන කළමනාකරු තනතුර 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අතර වැඩ බැලීමේ පදනම මත අවස්ථා 04 ක දී ඒ සඳහා කාර්යාංශ නිලධාරීන් පත් කර තිබුණද අපේක්ෂිත පරිදි ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය නොවීම හේතුවෙන් එම තනතුරේ වගකීම් නිසි පරිදි ඉටු කරන්නේද යන්න විගණනයේ දී ගැටළු සහගත විය.

(iv) මානව සම්පත් කළමනාකරු තනතුර වර්ෂ 06 ක් පුරප්පාඩු පැවත 2016 සැප්තැම්බර් 05 දින සිට වැඩ බැලීමේ පදනමින් කාර්යාංශ නිලධාරියකු පත්කර තිබුණි.

(v) සරප් තනතුර සඳහා ස්ථිර නලධාරියෙකු අනුයුක්ත කිරීම වෙනුවට කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් නිලධාරියෙකු පත්කර තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණය ගැති හා ණය හිමි පාලනය | දීර්ඝ කාලීනව අය නොවී පවතින ණය ශේෂ අයකර නොගැනීම සහ නිෂ්ක්‍රීයව පවතින ණය හිමි ශේෂ නිරවුල් නොකිරීම |
| (ආ) | මෙහෙයුම් පාලනය | සමාගම සතු ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැලසුම්ගත වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම. |
| (ඇ) | මූල්‍ය පාලනය | සමාගමට උපරිම ආර්ථික වාසි සැලසෙන පරිදි බැංකු ජංගම ගිණුම් සහ ස්ථාවර තැන්පතු නිසි කළමනාකරීත්වයකින් පවත්වාගෙන නොයාම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | සුදුසුකම්ලත් නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා නොගැනීම සහ මානව සම්පත් කළමනාකරණය ශක්තිමත් කිරීම. |